සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

## වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2018
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

- **පළමු අනිවාර්ය ප්‍රශ්නයටත් 02 - 07 දක්වා ප්‍රශ්නවලින් කැමති ප්‍රශ්න 04කටත් පිළිතුරු සපයන්න.**

(01) (1) ''එම්බා බෙත්ලෙහෙමේ එප්‍රාතා, තී ජුදාහී............................ ඉතා අල්ප වන්නේ ය.''

(a) ඉහත හිස්තැන පුරවන්න.

(b) එම දිවැස්වැකිය පවසන ලද දිවැසිවරයා නම් කරන්න.

(2) දස පනතෙහි ආගමික චාරිත්‍ර ඉටු කිරීම සම්බන්ධයෙන් දැක්වෙන පනත නම් කරන්න.

(3) පහත සඳහන් සිදුවීම් මගින් ජේසුස් වහන්සේ ඉගැන් වූ වැදගත් පාඩම බැගින් ලියා දක්වන්න.

(a) රාජතේජසින් ජෙරුසලමට පිවිසීම -

(b) දේව මාළිගාව පවිත්‍ර කිරීම -

(4) (a) පාවුල්තුමාට අනුව සදහට ම පවතින ධර්මතාව කුමක් ද?

(b) එහි ලක්ෂණ 2ක් ලියා දක්වන්න.

(5) ස්නාවක ජොහාන් පැවසූ පරිදි ජේසුස් වහන්සේ විසින් දෙනු ලබන බව්තීස්මයට අදාළ කරුණු 2ක් ලියන්න.

(6) (a) 'ක්‍රිස්තියානි' යන නාමය මුල්වරට ලැබූ සභාව කුමක් ද?

(b) එම සභාවේ ක්‍රියා කලාපයෙන් කිතුනුවන්ට ලබාගත හැකි ආදර්ශ 2ක් ලියන්න.

(7) පහත සඳහන් ප්‍රශ්න නගන ලද්දේ කවරකු විසින්දැයි ලියා දක්වන්න.

(a) 'සබත් දිනයේ දී' සුව කිරීම යුතු ද? අයුතු ද?

(b) සබත් දිනයේ දී නොකටයුත්තක් ඔබ කරන්නේ මන් ද?

(8) දෙවිවරු මිනිස් වෙසින් අප වෙතට බැස සිටිති.

↓

A අවස්ථාව

↓

B හවුල් සේවකයන්ගේ පිළිතුර

ඉහත A හා B අදාළ පිළිතුරු ලියා දක්වන්න.

(9) (a) ජේසුස් වහන්සේ ඉගැන් වූ නායකත්ව සංකල්පය කුමක් ද?

(b) උන්වහන්සේ එම සංකල්පය ආදර්ශයෙන් දැක් වූ අවස්ථාවක් නම් කරන්න.

(10) කොළොස්සි හසුනෙහි දැක්වෙන පරිදි කිතුනුවකු තුළ තිබිය යුතු ජීවිත ප්‍රතිපත්ති 2ක් ලියා දක්වන්න. (ලකුණු 2 10 = 20)

(02) 'ජේසුස් වහන්සේ යාච්ඤා කිරීමට ශ්‍රාවකයන්ට ඉගැන් වූ සේක.

(1) ස්වාමීන් වහන්සේ ඉගැන් වූ යැදුමට භාවිත වන වෙනත් නමක් ලියන්න. (ලකුණු 02)

Department of Education – Western Province

(2) ස්වාමින්ගේ යාච්ඤාවෙහි සඳහන් ඉල්ලීම් 3ක් ලියා දක්වන්න. (ලකුණු 03)
(3) යාච්ඤාව කිතුනුව ට වැදගත්වීමට හේතු 5ක් ලියා දක්වන්න. (ලකුණු 05)

(03) 'මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව'
(1) ඉහත ප්‍රකාශය හා අදාළ කැඳවීමක් ලද දිවැසිවරයා නම් කරන්න. (ලකුණු 02)
(2) එම දිවැසිවර කැඳවීමට අදාළ විශේෂ කරුණු 3ක් ලියා දක්වන්න. (ලකුණු 03)
(3) ඔබට පිවිතුරු කිතුනු දිවියක් ගත කිරීමට බාධා ගෙනෙන කරුණු 2ක් නම්කර, ඉන් මිදීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා කලාපය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) 'දේව රාජ්‍යයේ පුරවැසියන් තීරණාත්මක මොහොතකට මුහුණ දිය යුතු වේ.'
(1) දේව රාජ්‍යයේ පුරවැසියන් මුහුණ දිය යුතු තීරණාත්මක මොහොත කුමක් ද? (ලකුණු 02)
(2) පහත සංකේත මඟින් දේව රාජ්‍යයේ පුරවැසියකුට අඟවන අනතුරු මොනවාදැයි ලියා දක්වන්න.
(a) පටු දොරටුව
(b) ඉඟ පටි බැඳ පහන් දල්වා ගැනීම
(c) අත්තික්කා ගස - (ලකුණු 03)
(3) දේව රාජ්‍යයේ විශ්වාස දායක දාසයකු වීම සඳහා ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග 5ක් ලියා දක්වන්න. (ලකුණු 05)

(05) 'මුල් කිතුනු සභාව සෑම යුගයකට ම ආදර්ශයකි.'
(1) මුල් කිතුනු සභාවේ ආරම්භය සිදු වූයේ කවදා ද? (ලකුණු 02)
(2) මුල් කිතුනු සභාව පහත සඳහන් මාතෘකා යටතේ ඉටුකළ සේවාව බැගින් ලියන්න.
(a) ධර්මදාන සේවාව
(b) සුබසාධන සේවාව -
(c) නමස්කාර මෙහෙවර - (ලකුණු 03)
(3) මුල් සභාවෙන් වත්මන් කිතුනුවන්ට චරිතායනය කළ හැකි කිතුනු ලක්ෂණ 5ක් පෙළ ගස්වන්න. (ලකුණු 05)

(06) 'පාවුල්තුමා විජාතීන්ගේ අපෝස්තුළුවරයා ය.'
(1) පාවුල්තුමාට භාවිත වූ හෙබ්‍රෙව් හා රෝම නාම ලියා දක්වන්න.
(2) පහත සඳහන් මාතෘකා එක් වාක්‍යයකින් හඳුන්වා දෙන්න.
(a) පාවුල්තුමාගේ ආගමික පසුබිම -
(b) පාවුල්තුමාගේ අධ්‍යාපන පසුබිම -
(c) පාවුල්තුමාගේ රෝම පසුබිම -
(3) කිතුනු සභාව තුළ ඵලදායක මෙහෙවරක යෙදීම සඳහා පාවුල්තුමාගේ ධර්ම දූත චාරිකා මගින් ඔබට ලබාගත හැකි ආදර්ශ කවරේදැයි පහදන්න.

(07) පහත දී ඇති මාතෘකා අතුරෙන් 2ක් තෝරා ඒ පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(1) ජේසුස් වහන්සේ මුහුණ පෑ පරීක්ෂා
(2) මෝල්ටාවේ සාක්ෂි දරූ පාවුල්තුමා
(3) සොබාදහම අභිබවා දේව බලය ක්‍රියාත්මක වීම
(4) කිතුනු පවුලේ යුතුකම් හා වගකීම්

Department of Education - Western Province